ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2012/10/25 |

## ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පවත්වාගෙන යාම වඩාත් පහසු වෙයි.

ලෝක බැංකු කණ්ඩායම විසින් සිදු කරනු ලබන ව්‍යාපාර පවත්වාගෙන යාම පිළිබඳ ශ්‍රේණිගත කිරීමට අනුව 2013 වසරේ දී රටවල් 185 ක් අතුරින් ශ්‍රී ලංකාව 81 වැනි ස්ථානය ලබා ගෙන ඇත[1]. 2012 වසරේ ශ්‍රේණිගත කිරීම්වලට අනුව ලැබූ 89 වැනි ස්ථානය සමග සැසඳීමේ දී මෙය සැලකිය යුතු වර්ධනයකි. ශ්‍රී ලංකාව ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව වඩාත් වැඩිදියුණු කරගත් රටවල් අතුරින් දෙවන ස්ථානය ගනී.

ශ්‍රී ලංකාව 2013 වසරේ දී දකුණු ආසියාවේ ඉහළතම ශ්‍රේණිගත කිරීම ලද රට වන අතර, කලාපය තුළ තම ශ්‍රේණිය ඉහළ නංවාගත් එකම රට ද වේ. තව ද, වසර හතක කාලය තුළ ශ්‍රේණිගත කිරීමේ වඩාත් ඉහළ ප්‍රගතියක් දැක් වූ රටවල් අතරට ශ්‍රී ලංකාව මෙන්ම, දකුණු ආසියාතික රටක් පැමිණි ප්‍රථම අවස්ථාව මෙය වේ.

[1] 2012 ජූනි මස දක්වා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණවලට අනුව

ව්‍යාපාර පවත්වා ගෙන යාම පිළිබඳ ශ්‍රේණිගත කිරීම මගින් රටක ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව පිළිබිඹු කෙරේ. එය රටවල් 185 ක් අතර සැසඳීම් කළ හැකි, ව්‍යාපාර නියාමනය පිළිබඳ ප්‍රමාණාත්මක දර්ශක දහයකින් (10) සමන්විත වේ. මෙම දර්ශක සමූහය ව්‍යාපාරයක ජීවන චක්‍රය කෙරෙහි බලපාන රෙගුලාසිවලට අදාළව සැකසේ. මෙහි දී ආවරණය කෙරෙන අංශ වනුයේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම, ඉදිකිරීම් බලපත්‍ර ලබා ගැනීම, විදුලි බලය ලබා ගැනීම, දේපළ ලියාපදිංචි කිරීම, ණය ලබා ගැනීම, ආයෝජක සුරක්ෂිතභාවය, බදු ගෙවීම, දේශසීමා හරහා වෙළෙඳාම, ගිවිසුම් බලගැන්වීම සහ බුන්වත් බව විසඳා ගැනීමයි.

ශ්‍රී ලංකාව ව්‍යාපාරයක් ආරම්භ කිරීම, දේපළ ලියාපදිංචි කිරීම, ණය ලබා ගැනීම, බදු ගෙවීම සහ දේශසීමා අතර වෙළෙඳාම යන ක්ෂේත්‍රයන්හි බොහෝ නියාමන ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කර තිබේ. සේවක අර්ථසාධක අරමුදලෙහි හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලෙහි ලියාපදිංචි අංක ලබා ගැනීමේ ක්‍රියාවලිය පරිගණකගත කිරීම හා කඩිනම් කිරීම, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි විද්‍යුත් පද්ධතියක් හඳුන්වා දීම, ණය තොරතුරු කාර්යාංශයෙහි ඉලෙක්ට්‍රොනිකව සොයා බැලීම් කළ හැකි සුරක්ෂිත ලේඛනයක් පිහිටුවීම හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ නියාමනයන් නිකුත් කිරීම මගින් සුරක්ෂිත ගනුදෙනු පද්ධතිය ශක්තිමත් කිරීම, පිරිවැටුම් බදු අහෝසි කිරීම සහ සමාගම් ආදායම් බදු, එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු අනුපාතිකය අඩු කිරීම මගින් ව්‍යාපාරයක බදු පිරිවැය අඩු කිරීම සහ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් ASYCUDA ලෝක ඉලෙක්ට්‍රොනික දත්ත හුවමාරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම මගින් අපනයන සඳහා ගතවන කාලය අඩු කිරීම මෙයට ඇතුළත් වේ.

ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයන්හි කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නැංවිය හැකි වන පරිදි, රට තුළ ව්‍යාපාරික පරිසරය හා ව්‍යාපාර පවත්වා ගෙන යාම පිළිබඳ ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කර ගැනීම සඳහා වැඩිදුර ප්‍රතිසංස්කරණයන් මේ වනවිට සිදු කෙරෙමින් පවතී.